# නව පෝර සහනාධාර ක්‍රමය

ශ්‍රී ලංකා ගොවි ජනතාවගේ ඉදිරිගමනට ප්‍රධාන බාධකයක් මගහරවමින් ලංකා පොහොර සංස්ථාව විසින් නව පොහොර සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත. ගොවි කටයුතු ක්ෂේත්‍රයේ රටාව මූලික වශයෙන්ම වෙනස් කෙරෙන ඉතා වැදගත් ප්‍රතිපත්ති රැසක් පසුගිය වසර කිහිපය තුළ ක්‍රියාත්මක කළ බව නොකිවමනාය. එහෙත් ඒ සමගම ඇතිවූ තෙල් අර්බුදය වැනි ලෝක ආර්ථික විෂමතාවයන් නිසා, මෙම නව පිළිවෙත් වල මූලික අරමුණ වූ කෘෂිකාර්මික සංවර්ධනය නොසිතූ අයුරින් අඩාල වන තැනට කටයුතු යෙදිණ.

ගොවි ජනතාවට හා වගාකරුවන්ට දිරිදීම් වස් පොහොර සංස්ථාව මගින් බලපත්‍ර සහනාධාර ක්‍රමයක් යටතේ පොහොර සපයන ලද්දේ වී, තේ හා පොල් වගාවන් සඳහා පමණි. මේ අතර පොහොර මිල තවත් ඉහළ යෑමෙන් තත්ත්වය වඩා උග්‍රවිය. මින් මිදීමට නම් සියලුම වගාවන් සඳහා බලපවත්වන අයුරින් පොහොර සහනාධාර ක්‍රමයක් ක්‍රියාත්මක කළයුතු යැයි කෘෂිකර්ම හා ආහාර ඇමතිතුමා විසින් 1973 දී රජයට යෝජනා කරන ලදී. එහෙත් දුර්වල මුදල් තත්ත්වය නිසාවෙන් එය ක්‍රියාත්මක කිරීම කල් දමන්නට සිදුවිය.

පසුගිය අයවැයෙන් එම යෝජිත පොහොර සහනාධාර ක්‍රමය සඳහා මුදල් ඇමතිතුමාගේ අනුමතිය ලැබුනෙන් පොහොර සංස්ථාව මගින් සියලුම වගාවන් සඳහා බලපැවැත්වෙන අයුරින් සියයට පණහක නව පොහොර සහනාධාර ක්‍රමය පසුගිය අප්‍රේල් මස සිට ක්‍රියාත්මක කරන ලදී. නව ක්‍රමය යටතේ මුල් සහනාධාරය ක්‍රමය යටතේ ගොවියාට නොලැබුන පහසුකම් රැසක්ම ලබාදීමට සංස්ථාව අදහස් කරයි.

මෙහිලා මුල් පියවරක් හැටියට සහනාධාර බලපත් ක්‍රමය අවලංගු කර ඇත. ඒ අනුව ගොවීන්ට හා සෙසු බෝග වගා කරුවන්ට පෝර ලබා ගැනීම සඳහා මෙතෙක් පැවැති බලපත් ලබාගත යුතු නොවේ. මෙවැනි කාර්යාලමය කටයුතු සඳහා තම කාලය හා ශ්‍රමය මිඩංගු නොකර, තම අවශ්‍යතාවයන් ලබා ගැනීමට ඔවුනට හැකිය. විදේශ වත්කම් වලින් ප්‍රධාන කොටසක් සපයන රබර් වගාව සඳහා සහනාධාර ක්‍රමයක් මෙතෙක් නොවීය. මෙම තත්ත්වයද නව ක්‍රමය නිසාවෙන් මගහැරී ඇත. පොල් වගාව සඳහා සහනාධාර ක්‍රමයක් තිබුනද ඒ සඳහාද බලපත්‍රයක් ලබාගත යුතුවිය. මෙම තත්ත්වයද දැන් නැත. තේ වගාව හැර සෙසු සියලුම වගාවන් සඳහා මින් ඉදිරියට බලපත් ලබා ගත යුතු නොවේ.

තේ වගාව සඳහා තේ පාලන දෙපාර්තමේන්තුවේ ද බලපත්‍රය තවදුරටත් අවශ්‍යවේ. එහෙත් මෙහිලා අවශ්‍යවන කාර්යාලමය කටයුතු වගාකරුවන්ට පහසුව සැලසෙන අයුරින් ලිහිල් කර ඇත.

මේ හැර ගෙවතු වගාවන්ට අවශ්‍ය වන පොහොර අලෙවි මධ්‍යස්ථානයක් පොහොර සංස්ථා ප්‍රධාන කාර්යාලයේ විවෘත කර ඇත. මෙම මධ්‍යස්ථානයෙන් ඕනෑම කෙනෙකුට තම අවශ්‍යතාවයන් මිළදී ගැනීමට හැකිය. මෙවැනි අලෙවි මධ්‍යස්ථාන දිවයින පුරා පිහිටුවීමට සංස්ථාව අදහස් කරයි. සෙසු අලෙවි මධ්‍යස්ථාන, කෘෂිකාර්මික පලදාවර්ධන කමිටු, විවිධ සේවා සමුපකාර සමිති වැනි ජනතා සංවිධාන හා සම්බන්ධව පිහිටුවනු ඇත. මෙවැනි ජනතා සංවිධාන මෙහිලා උත්සුක නොවන්නේ නම් පමණක් පෞද්ගලික වෙළඳුන්ගේ සහාය මේ සඳහා යොදවා ගනු ඇත. ගොවිජනතා අවශ්‍යතාවයන් ඔවුන්ගේ ප්‍රදේශ වලදී සහනාධාර මිලටම සැපයීම සංස්ථාව මෙහිලා තම ප්‍රතිපත්තිය කරගෙන ඇත.

මෙම මධ්‍යස්ථාන පිහිටුවනතුරු ප්‍රාදේශීක අවශ්‍යතාවයන් තම පළාත්වලට ගෙනයන

වෙළඳුන්ට ඒ සඳහා ඉතා සුළු ප්‍රමාණයක ලාභයක් ගන්නා ලෙස සංස්ථාව උපදෙස් දී ඇත. මෙය ප්‍රවාහණ ගාස්තු පියවා ගැනීමට පමණක් සරිලන එකක් විය යුතු වේ. ප්‍රාදේශීය අලෙවි මධ්‍යස්ථාන විවෘත කළ පසු, අලෙවි නියෝජිතයන්ට කොමිස් මුදලක් ගෙවා කොළඹ සහනාධාර මිලටම මෙම පොහොර සැපයීමේ හැකියාවන් ගැන සංස්ථාව මගින් සොයා බලනු ඇත.

## පෝර සහනාධාර අතීත කතාව

**වී–** වී ගොවිතැනට අවශ්‍ය පොහොර සඳහා සහනාධාර ක්‍රමයක් මුලින්ම ක්‍රියාත්මක කරන ලද්දේ 1952 දීය. මෙය කාල යත් සමග නොයෙකුත් ප්‍රමාණ අනුව වෙනස් වී 1968 දී 50% ක් විය. තෙල් අර්බුදයත් සමග පොහොර මිළ දැඩි ලෙස ඉහළ ගියෙන් 1974 ජූලි මාසයේ දී එය ඉවත් කරන ලදී. 1974 ඔක්තෝබර් මාසයේ දී 33% සහනාධාරයක් යළි ඇති කරන ලදී. 1975 සහනාධාර ක්‍රමය යටතේ දූන් එය යළිත් 50% දක්වා වැඩිකර ඇත.

**තේ–** තේ වගාව සඳහා මුලින්ම මුදල් ආධාරයක් පමණක් දෙන ලදී. මෙය තේ නැවත වගා කිරීම සඳහා අක්කර 100 අඩු ඉඩම් හිමියන්ට පමණක් ගෙවන ලදී. නැවත සිටුවීමේ දී අවශ්‍ය පොහොර මිලෙන් බාගයක් පමණ මෙසේ ගෙවන ලදී.

තේ සඳහා සහනාධාරයක් ලැබුනේ 1967 දීය. මෙය සුළු ඉඩම් හිමියන්ට හා අක්කර 100 ට අඩු ඉඩම් හිමියන් සඳහා විය. ආරම්භයේ දී අක්කරයකට රු: 80/– ක් වූ අතර 1968 අප්‍රේල් මස රු: 100/– දක්වා වැඩි කරන ලදී.

1974 සියලුම තේ වගා සඳහා 50% සහනාධාරයක් ලබා ගැනීමට ඉඩ සලසන ලදී.

**පොල් –** පොල් ඉඩම් වලට රසායනික පොහොර යෙදීම ව්‍යාප්ත කරලීම සඳහා 1958 මුල් වරට සහනාධාරයක් දෙන ලදී. අක්කර 20 ට අඩු ඉඩම් හිමියන්ට 50% ක්ද අක්කර 20 ට වැඩි ඉඩම් හිමියන්ට 33 1/3% ක් සහනාධාරයක් මේ යටතේ ලැබුණි. 1966 අක්කරයකට වැඩි සියලුම පොල් ඉඩම් සඳහා 50% ක සහනාධාරයක් ලබා දෙන ලදී.

**රබර් –** රබර් සඳහා මෙතෙක් කිසිදු සහනාධාරයක් නොවිය. රබර් පාලක තැනගේ අනුමැතිය ලැබුණු සුළු ඉඩම් හිමියනට රබර් යළි වගා කිරීම සඳහා පමණක් පොහොර සහනාධාර මිලක් යටතේ ලබාදෙන ලදී.

**සෙසු බෝග –** බෝග විවිධාංගකරණය යටතේ බෝග හඳුන්වා දීමේ දී පමණක් සහනාධාර මිළකට පොහොර සපයන ලදී.

සුළු අපනයන බෝගවලට 50% සහනාධාරයක් ලැබුණි.

ගොවිතැන් හා වැවිලි බෝග සඳහා වන නිර්දේශිත ප්‍රමාණවලින්, නියමිත පොහොර ප්‍රමාණ යෙදවූයේ තේ සඳහා පමණක් බව පැහැදිලිව ඇත. සෙසු බෝග සඳහා නියමිත ප්‍රමාණයන් නොයෙදීමට හේතු සළකා බැලූ රජය මිල ගණන පහත හෙළීම මේ තත්ත්වය මඟහැරවීමට ගතයුතු වැදගත් පියවරක් බව නිගමනය කරන ලදී.

වැඩි පලදාවක් සඳහා අවශ්‍ය පොහොර ප්‍රමාණයන් යෙදීම වැදගත්ම අවශ්‍යතාවයකි. විශේෂයෙන්ම වැඩි අස්වැන්න දෙන නව වී වර්ග වලින් නියමිත ප්‍රයෝජන ගැනීමට නිර්දේශිත ප්‍රමාණවලින් පොහොර යෙදිය යුතුවම ඇත. මෙය කළ හැකි වාතාවරණයක් ගොවි ජනතාවට සළසා දීම නව පොහොර සහනාධාර ක්‍රමයේ මූලික අරමුණ වන්නේය. මින් නියම ප්‍රයෝජන ගෙන අපරට ස්වයංපෝෂිත කරලීමට ගොවි ජනතාව ක්‍රියා කරනු ඇතැයි ලංකා පොහොර සංස්ථාව උදක්ම බලාපොරොත්තුවේ.

# නව සහනාධාර මිළ ගණන්

(හොණ්ඩරයක් සඳහා)

| | පැරණි මිළ | නව මිළ |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| ඇමෝනියම් ... ... | 74.25 | 37.12 |
| මිශ්‍ර කැට පෝර... ... | 110.70 | 55.00 |
| වී 1 මිශ්‍රණය ... ... | 123.35 | 61.70 |
| වී 2 මිශ්‍රණය ... ... | 51.70 | 25.85 |
| වී 2 තාන්ද්‍රිය මිශ්‍රණය ... | 134.75 | 67.40 |
| වී 3 මිශ්‍රණය ... ... | 128.00 | 64.00 |
| ටී.ඩී.ඇම්. 1 මිශ්‍රණය ... | 116.95 | 58.50 |
| ටී.ඩී.ඇම්. 2 මිශ්‍රණය ... | 111.25 | 55.65 |
| ටී.ඩී.ඇම්. 3 මිශ්‍රණය ... | 99.95 | 50.00 |
| ඇමෝනියම් සල්ෆේට් ... | 74.24 | 37.12 |
| රොක් පොස්පේට් ... | 41.80 | 20.90 |
| මියුරේට් ඔෆ් පොටෑෂ්... | 151.40 | 75.70 |
| සාන්ද්‍ර සුපර් පොස්පේට් | 151.40 | 75.70 |
| යූරියා ... ... | 134.30 | 67.15 |

ඇසුරුම් කරන ලද පෝර

| | සාමාන්‍ය මිශ්‍රන | | විශේෂ මිශ්‍රන | |
|---|---|---|---|---|
| | පැරණි මිළ | නව මිළ | පැරණි මිළ | නව මිළ |
| | රු. ශ. | රු. ශ. | රු. ශ. | රු. ශ. |
| සාමාන්‍ය එළවළු | 60.00 | 30.00 | — | — |
| කොල එළවළු | — | — | 79.50 | 39.75 |
| ගෙඩි එළවළු | — | — | 87.50 | 43.75 |
| ඇනු | 55.00 | 27.50 | 107.50 | 53.75 |
| මිරිස් | 67.25 | 33.63 | 97.00 | 48.50 |
| ගෙවතු වගා | 60.00 | 30.00 | 72.25 | 36.38 |
| අර්තාපල් | 62.75 | 30.63 | 97.00 | 48.50 |
| තක්කාලි | 55.00 | 27.50 | — | — |
| කෙසෙල් | 67.25 | 33.63 | 82.75 | 41.38 |
| අන්නාසි | — | — | 82.75 | 41.38 |
| වැල් දෙඩම් | — | — | 82.75 | 41.38 |
| පැපොල් හා විශේෂ පළතුරු | — | — | 77.50 | 38.75 |
| සෝයා බෝංචි | — | — | 83.50 | 41.75 |
| රට කජු | — | — | 115.75 | 57.88 |
| කරදමුංගු | 60.00 | 30.00 | — | — |
| ගම්මිරිස් | — | — | 82.75 | 41.38 |
| උක් 1 | — | — | 99.25 | 49.63 |
| උක් 11 | — | — | 103.50 | 51.75 |
| දුම්කොල | — | — | 97.00 | 48.50 |
| දුම්කොල (පැල) | — | — | 99.25 | 49.63 |
| බුලත් | 60.00 | 30.00 | — | — |
| කෝපි | 55.00 | 27.50 | — | — |
| කව්පි හා බෝංචි | — | — | 77.50 | 38.75 |